සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 43 S I |

# චිත්‍ර I

**කාලය පැය 01 යි**

**සැලකිය යුතුයි.**

* සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

❖ **පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**



01. ක්‍රි.ව. 1341-1351 කාලයට අයත් මෙම වාස්තු විද්‍යා නිර්මාණය .................................................................................. නමින් හැඳින්වේ.

02. මෙම නිර්මාණය .................................................................. රජුගේ රාජ්‍ය අනුග්‍රහය යටතේ කරවන ලදි.

03. තනි කලුගලින් ඉදිකළ එකම බෞද්ධ විහාරයක් වන මෙහි නිර්මාණ ශිල්පියා වන්නේ,.................................. ය.

04. මෙම ගෘහ නිර්මාණය තුළින් දකුණු ඉන්දීය ............................................................ ගෘහ නිර්මාණ කලා ලක්ෂණ පෙන්වයි.

05. මෙම විහාරයේ මණ්ඩපය පාදමෙහි ජීව ශක්තියෙන් යුතු ......................................................... ගේ රූප පෙළක් කැටයම් කර ඇත.

❖ **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06. ශ්‍රී ලාංකීය චිත්‍ර කලා විකාශනයේ යුග දෙකක කලා ශෛලීන් දැකිය හැකි පොළොන්නරු යුගයේ ගොඩනැගිල්ල කුමක්ද? ...................................................................................................

07. සතුන්ගේ ඉරියව් ගති ලක්ෂණ , චලනය මනාව දැක්වෙන ඡද්දන්ත ජාතකය කැටයම දක්නට ඇත්තේ සාංචියේ කුමන තොරණෙහිද? ............................................................................

08. ඇම්බැක්කේ ලී කැටයම් අතර, දරුවෙකුට කිරිපොවන මව කැටයම දැකිය හැකි ගොඩනැගිල්ල කුමක්ද?
..............................................................................

09. කුරානයේ ඇති පාඨ අරාබි බසින් පල්ලියේ බිත්තිය මත විචිත්‍රව ලිවීමේ කලාව හඳුන්වන්නේ කුමන නමකින්ද?
.................................................................................

10. අඩි 17 ක් දිග බයිසන් ගව රූපය දැකිය හැකි ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගුහාව කුමක්ද?
............................................................................................

❖ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11. ලංකාවේ නූතන චිත්‍ර කලාවේ නව සම්ප්‍රදායක් වන ව්‍යූක්ත කලා සම්ප්‍රදාය බිහි කිරීමට පුරෝගාමී වූ ජපන් හා ඇමෙරිකානු චිත්‍ර කලා අභාෂය ලබාගත් ශිල්පියා වනුයේ,

i. ඩේවිඩ් පේන්ටර්ය. ii. එච්.ඒ. කරුණාරත්නය
iii. ජෝර්ජ් කීට්ය. iv. සුමන දිසානායකය.

12. අනුරාධපුර යුගයේ ක්‍රි.ව. 7 වන සියවසට අයත් ශෛලමය බුද්ධ ප්‍රතිමාව වන්නේ,

i. තොළුවිල බුදු පිළිමය ii. පන්කුලිය බුදු පිළිමය
iii. සමාධි බුදු පිළිමය iv. අවුකන බුදු පිළිමය

13. ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති ඇලෙක්සැන්ඩ්‍රොස් නම් ශිල්පියාගේ නිර්මාණය

i. හෙලනිස්ටික් යුගයට අයත්ය. ii. අමර්නා යුගයට අයත්ය.
iii. සම්භාව්‍ය යුගයට අයත්ය iv. ග්‍රීක පෞරාණික යුගයට අයත්ය.

14. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ ශෛලිගත ආකාරයෙන් දක්නට ලැබෙන කලා කෘතියක් සේ සැළකෙන්නේ,

i. කවන්ද මිනිස් රුවයි ii. නළඟන රුවයි iii. ජගන්මාතා රුවයි iv. පූජක රුවයි

15. දිය සායම් මාධ්‍යයෙන් කරවන ලද චිත්‍රයක විශේෂයෙන්ම තිබිය යුතු වැදගත් ලක්ෂණයක් වනුයේ,

i. ජලය අඩුවෙන් මිශ්‍ර කර පදාස වශයෙන් ඝනත්වය පෙන්වීමයි.
ii. විනිවිද පෙනෙන ලෙස වර්ණ ශක්තීන් මතු කිරීමයි.
iii. වර්ණවලින් ත්‍රිමාණ ලක්ෂණ පෙන්වීමයි.
iv. ජලය වැඩියෙන් මිශ්‍රකර වර්ණ බොඳවී යන ආකාරයට වර්ණ ගැන්වීමයි.

❖ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර ලියන්න.**

16. සාරානාත් බුදු පිළිමය ඉන්දීය ........................................................ යුගයේ නිර්මාණය වූ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි.

17. නිශ්ශංකමල්ල රජුගේ නිර්මාණයක් වන නිශ්ශංකලතා මණ්ඩපයේ මධ්‍යයෙහි ඇති බුබ්බුලාකාර දාගැබේ පාදමේ අලංකාරව ............................................................................ රූප කැටයම් කර ඇත.

18. 20 වන සියවසේ මුල් භාගයට අයත් ලාංකීය ශාස්ත්‍රාලීය යථාර්ථවාදී චිත්‍ර කලාවේ පුරෝගාමී ශිල්පියෙකු වූ ................................................................. ලංකා කලා සංගමයට අයත් ශිල්පියෙකි.

19. ඉසුරුමුණි විහාරයෙහි නිර්මාණය කර ඇති ඇත් රූප ඉන්දියාවේ පල්ලව කලා සම්ප්‍රදායට අයත් මහා බලිපුරම්හි ................................................................................... කැටයමේ ඇත් රූප වලට සමාන ලක්ෂණ පෙන්නුම් කරන බව විචාරක මතයයි.

20. ඉතාලි පුබුදු යුගයට අයත් අන්තිම විනිශ්චය (LAST JUDGMENT ) සිතුවම .................................................... ................................................................... බිත්තියේ සිතුවම් කර ඇත.

❖ **අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට ඍජු සබඳතාවයක් දැක්වෙන රූප සටහනඉදිරියෙන් ඇති A,B,C,D,E යන රූප සටහන් අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

21. 

(.......................)



A 

22. 

(.......................)

B 


23.  (........................) C 

24.  (........................) D 

25.  (........................) E 

❖ අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්න වලට F,G,H,I,J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

26. F අක්ෂරයෙන් දැක්වෙන කරගම්පිටිය විහාර සිතුවම කුමන නමකින් හැඳින්වේද?
..................................................................................................................

27. G අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය දැකිය හැකි වන්නේ කුමන ස්ථානයකද?
..................................................................................................................

28. H අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කළ ශිල්පියා වනුයේ කවුරුන්ද?
..................................................................................................................

29. I අක්ෂරයෙන් දැක්වෙන අජන්තා බිතු සිතුවමේ තේමාව කුමක්ද?
..................................................................................................................

30. J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය කුමන කලා සම්ප්‍රදායට අයත් වේද? ......................................................................

අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිළි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

31. පාට්ටුත්තිරක්කාල් - ................................................................................................................................

................................................................................................................................

32. යටි පුවරුව - ................................................................................................................................

................................................................................................................................

33. නයික් (NIKE) - ................................................................................................................................

................................................................................................................................

34. කිරි හිඳවීම - ................................................................................................................................

................................................................................................................................

35. පුංචි සිඤ්ඤෝ - ................................................................................................................................

................................................................................................................................

* මෙහි දැක්වෙන සිතුවම හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය 05 ක් ලියන්න.



36. තේමාව - ................................................................................................................................

37. ශිල්පියා - ................................................................................................................................

38. මාධ්‍ය - ................................................................................................................................

39. සම්පිණ්ඩනය - ................................................................................................................................

................................................................................................................................

40. කලා ආභාසය- ................................................................................................................................

................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 **43 S II**

# චිත්‍ර II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙපරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

## නිදහස් රේඛාමය චිත්‍ර ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

❖ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

● මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාරදෙන්න.

● ඔබගේ චිත්‍ර ඇගයීමේ දී පහත කරුණු කෙරෙහි සැළකිලිමත් වන බව සළකන්න.

❖ රේඛා අධ්‍යයනය

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතාවය

❖ වර්ණ චිත්‍රය

1. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම.
2. පරිමාණය, පර්යාවලෝක රීති සහ ත්‍රිමාණ ලක්‍ෂණ පිළිබඳ අවබෝධය
3. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය සහ ගති ලක්‍ෂණ දැක්වීම.
4. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
5. උචිත පසුබිමක් යෙදීම සහ සමස්ත නිමාව.

**සැළකිය යුතුයි:**

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 43 | S | III

# චිත්‍ර III

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
* ඔබගේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුපිටේ පැහැදිළිව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

❖ "අ" කොටසින් හෝ "ආ" කොටසින් හෝ "ඇ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.

## (අ) කොටස - චිත්‍ර සංරචනය

1. ආගමික උත්සවයක්
2. විඩා නිවන ගොවියෝ සහ ගෙවිලියෝ
3. වෙළපොලක්
4. මහා වනාන්තරයක දිය බොන මුව රංචුවක්

## (ආ) කොටස - මෝස්තර නිර්මාණය

5. ළමා ඇඳුම් මැසීමට සුදුසු චීත්ත රෙද්දකට ගැළපෙන ව්‍යාප්ත මෝස්තරයක් අඟල් 9x9 ප්‍රමාණයට නිර්මාණය කරන්න.
6. සාරි පල්ලුවක් සඳහා පාරම්පරික සැරසිලි ඒකක භාවිතයෙන් මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. කුඩයක රෙද්දකට සුදුසු වර්ණවත් මෝස්තරයක් නිර්මාණය කරන්න.

## (ඇ) කොටස - ග්‍රැෆික් නිර්මාණ

8. නවතම ගුවන් සමාගමක් සඳහා ලාංඡනයක්නිර්මාණය කරන්න.
9. "ළමා අයිතීන් සුරකිමු" යන තේමාව යටතේ සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පැණි බීම බෝතලයකටසුදුසු අලංකාර ලේබලයක් නිර්මාණය කරන්න.

# අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018
## චිත්‍ර - 11 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

*** <u>යෝජිත ද්‍රව්‍ය</u>**

1. කාඩ්බෝඩ් පෙට්ටියක් (25cm x 20cm x10cm) ඉවත දමන බිස්කට් පෙට්ටියක්, සුදු කඩදාසියකින් ආවරණය කරගන්න.
2. විෂ්කම්භය අඟල් 5ක ප්‍රමාණයේ ප්ලාස්ටික් බෝලයක්
3. කොටු රෙදි කැබැල්ලක් (මීටර් 1/2 ක් පමණ)
4. අලියාබීම බෝතලයක් (450ml)
5. ඇන්තූරියම් මලක් සහ ඇන්තූරියම් කොළ 02 ක්
6. ද්‍රව්‍ය සමූහය තැබීමට සුදුසු ආධාරකයක්

1. ගඩලාදෙණි විහාරය
2. iv වන බුවනෙකබාහු
3. ගනේෂ්වරාචාර්ය
4. විජයනගර්
5. නටන්නන්ගේ සහ වයන්නන්ගේ
6. තිවංක පිළිම ගෙය
7. උතුරු තොරණෙහි
8. වාහල්කඩ මණ්ඩපය
9. කැලියෝග්‍රැෆි / කැලිග්‍රැෆි
10. ප්‍රංශයේ ලැස්කෝ ගුහාව
11. ii
12. i
13. i
14. iv
15. ii
16. ගුප්ත
17. වන්දනාවේ යෙදෙන මානව
18. මුදලිඳු ඒ.සී.ජී.එස්. අමරසේකර
19. ආකාශ ගංගාව රෝහන
20. රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේඅල්තාරයපිටුපස
21. C
22. D
23. E
24. A
25. B
26. පෙළඹවීම (මාරදූවරු)
27. ඉනුවල් පරරාසේකර පිල්ලෙයාර් කෝවිලෙහි
28. හෙන්රි මුවර් ශිල්පියා
29. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම.
30. ගාන්ධාර කලා සම්ප්‍රදාය

31. සන්නිදර්ශන චිත්‍ර ශිල්පියෙකු වූ වෛතීසවරම් සිව සුබ්‍රමනියම් (රමණී) විසින් නිර්මාණය කරන ලද පොත් පිට කවර නිර්මාණයකි.

32. පැරණි චිත්‍ර ශිල්පාචාරීන් රේඛා ප්‍රගුණ කිරීම සඳහා භාවිතා කළ පුවරුවකි / අතීතයේ චිත්‍ර ශිල්පය හදාරණ ගෝලයින් ප්‍රථමයෙන් රේඛා අධ්‍යනය කිරීමට භාවිතා කළ පුවරුව.

33. ග්‍රීක ඇතීනා දෙවඟන මූර්තියේ දකුණු අත්ලේ නිර්මාණය කර ඇති ජයග්‍රහණය සංකේතවත් කරන ඉපැරණි ග්‍රීක දේවතාවියගේ රුව

34. වෙස් මුහුණු කලා කර්මාන්තයේ එක් නිර්මාණ අවස්ථාවක් / වෙස් මුහුණු කර්මාන්තයේ දී වෙස් මුහුණු වර්ණ කිරීමට ප්‍රථම කිරි ගතිය ඉවත් කිරීම සඳහා දුමේ හෝ මඳ අව්වේ වියළා ගැනීම.

35. මෙය පුවත් පත් කාටුන් ශිල්පියෙකු වූ ඩබ්.ආර්.විජේසෝම ශිල්පියාගේ ජනප්‍රිය කාටුන් චරිතයකි.

36. මෙයින් නිරූපණය වන්නේ උළු පෝරණුව නම් සිතුවමයි.

37. මෙම සිතුවම G.S. ප්‍රනාන්දු චිත්‍ර ශිල්පියාගේ නිර්මාණයකි.

38. මෙම සිතුවම කඩදාසිය මත දියසායම් මාධ්‍යයෙන් ඇඳ ඇත.

39. තලය මත රූප සංරචනය කිරීමේදී පෙර බිම, මැද බිම හා පසු බිම මත රූප පිහිටුවමින් චිත්‍රයේ ගැඹුර හා පර්යාවලෝකනය ලක්ෂණ සහිතව නිරූපණය කර ඇත.

40. යුරෝපීය භූමි දර්ශන සිතුවම්වල ආභාසය සහිතව ස්වාභාවිකවාදී ශෛලයකින් නිර්මාණය කර ඇත.

